PN/SSCL/2022-01
21.09.2022

# දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

## බදු ගෙවන්නන් වෙත කෙරෙන දැනුම්දීමයි

## 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත ක්‍රියාත්මක කිරීම

### 1. පැනවීම

2022 අංක 25 දරණ සමාජ ආරක්ෂණ දායක්තව බදු පනත මගින් 2.5% ක බදු අනුප්‍රමාණයෙන් සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද 2022 ඔක්තෝබර් 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පනවනු ලැබේ.

### 2. බැදියාවේ විෂය පථය (2 වන වගන්තිය)

පහත දක්වා ඇති සෑම තැනැත්තෙකුම සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද ගෙවිය යුතුය;

(අ) යම් ද්‍රව්‍යයක් ආනයනය කරනු ලබන;

(ආ) යම් ද්‍රව්‍යයක් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් කරනු ලබන;

(ඇ) ඕනෑම ස්වභාවයකට අයත් සේවාවක් සැපයීමේ ව්‍යාපාරයක් කරනු ලබන; හෝ

(ඈ) (ආ) ඡේදයේ විධිවිධාන අදාල වන පරිදි නිෂ්පාදකයකු වන්නා වූ තැනැත්තකු විසින් සිදු කරන විකිණීමක් හැර, යම් ද්‍රව්‍යයක් ආනයනය කිරීම සහ විකිණීම ඇතුළු එවැනි ද්‍රව්‍යයක තොග හෝ සිල්ලර ව්‍යාපාරයක් කරනු ලබන.

### 3. ලියාපදිංචි වීම (4 වන වගන්තිය)

යම් ද්‍රව්‍යයක් ආනයනය කරන තැනැත්තෙකු හැර බදු අය කළ හැකි සෑම තැනැත්තෙකුම ( 2 වන වගන්තියේ දක්වා ඇති) ලියාපදිංචි වීම අවශ්‍ය වේ.

**තම පිරිවැටුම දැනටමත් රුපියල් මිලියන 120 ඉක්මවන තැනැත්තන්**

| | | |
|---|---|---|
| නිදහස් කර ඇති ද්‍රව්‍ය සහ සේවාවන් මගින් වන පිරිවැටුම හැර සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත ක්‍රියාත්මක වන දිනට වහාම පෙරාතුව මාස දොළහක් ඇතුලත සමුච්චිත පිරිවැටුම රු. 120,000,000/- ඉක්මවන්නේ නම් | - | සමාජ ආරක්ෂණ බදු පනත ක්‍රියාත්මක වන දින සිට දින පහළොවකට නොඅඩු කාල පරිච්ඡේදයක් තුළ |

උදා :- 2021.10.01 සිට 2022.09.30 දක්වා කාල පරිච්ඡේදය සඳහා පිරිවැටුම ( මුළු පිරිවැටුම - නිදහස් කළ ද්‍රව්‍ය හෝ සේවා මගින් වන පිරිවැටුම) රුපියල් මිලියන 120 ඉක්මවන්නේ නම්, එවැනි තැනැත්තෙකු 2022 ඔක්තෝබර් මස 15 වන දින හෝ එදිනට පෙරාතුව ලියාපදිංචි විය යුතුය.

(i) **වෙනත් තැනැත්තෙකු**

| | | |
|---|---|---|
| වෙනත් යම් තැනැත්තෙකු සඳහා කාර්තුවකට රු.30,000,000/- | - | ඉහත (i) වන අයිතමය යටතට නොවැටෙන තැනැත්තෙකු නම් කාර්තුවකට රුපියල් මිලියන 30 ඉක්මවන දින සිට දින පහළොවකට නොඅඩු කාල පරිච්ඡේදයක් තුල |

- **බදු ගෙවන්නා හඳුනා ගැනීමේ අංකයක් (බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකය) හිමි තැනැත්තන්** හට **බදු වර්ග ලියාපදිංචි ආකෘති පත්‍රය** (**TPR_ 005(SSCL)** (දේශීය ආදායම් දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙන් භාගත කර ගත හැකිය) නිසි පරිදි පුරවා පහත අංශයන්ට ඉදිරිපත් කිරීමෙන් ලියාපදිංචිය ලබාගත හැකිය;
  - ප්‍රධාන කාර්යාලය සහ බාලදක්ෂ ගොඩනැගිල්ල තුළ පවත්වා ගෙන යනු ලබන බදු ගොනු සඳහා ප්‍රධාන කාර්යාලයේ පිහිටා ඇති බදු වර්ග ලියාපදිංචි කිරීමේ අංශය
  - නගරබද / ප්‍රාදේශීය කාර්යාල තුළ පවත්වා ගෙන යනු ලබන බදු ගොනු සඳහා අවස්ථාවෝචිත පරිදි යම් නගරබද/ප්‍රාදේශීය කාර්යාල

- **අනිකුත් තැනැත්තන්** (බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකයක් නොමැති) බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකයක් ලබාගැනීම අවශ්‍ය වන අතර [දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ ඊ සේවාව භාවිතා කරමින් හෝ නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් ආකෘතිය (TPR-001හෝ TPR-002) ප්‍රධාන කාර්යාලයේ ප්‍රාථමික ලියාපදිංචි කිරීමේ අංශයට හෝ ඕනෑම නගරබද/ප්‍රාදේශීය කාර්යාලයකට භාරදීම මගින්] සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත සඳහා ලියාපදිංචි වීමට, බදු වර්ග ලියාපදිංචි කිරීමේ අංශයට හෝ නගරබද/ප්‍රාදේශීය කාර්යාල වෙත **බදු වර්ග ලියාපදිංචි කිරීමේ ආකෘති පත්‍රය** සම්පූර්ණ කර ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ.

## 4. සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද ගෙවීම (17 වන වගන්තිය)

ස්වතක්සේරු පදනම මත ත්‍රෛමාසික වාරික ලෙස සමාජ ආරක්ෂණ බද්ද ගෙවිය හැකිය. ගෙවීම සිදුකිරීමට නියමිත දිනයන් පහත දැක්වේ.

### i. ගෙවීම සිදුකිරීමට නියමිත දිනයන්

| **වාරිකය** | **ගෙවිය යුතු දිනය** |
|---|---|
| පළමු වාරිකය | අදාළ කාර්තුවේ දෙවන මාසයේ 20 වන දිනට හෝ එදිනට පෙර පළමු මාසය සඳහා නියමිත බද්ද ගෙවිය යුතුය. |
| දෙවන වාරිකය | අදාළ කාර්තුවේ තුන්වන මාසයේ 20 වන දිනට හෝ එදිනට පෙර දෙවන මාසය සඳහා නියමිත බද්ද ගෙවිය යුතුය. |
| තුන්වන වාරිකය | එකී අදාළ කාර්තුව අවසානයේ ඉන් ඉක්බිතිව එළඹෙන මාසයෙහි 20 වන දින හෝ එදිනට පෙර තුන්වන මාසය සඳහා නියමිත බද්ද ගෙවිය යුතුය. |

### ii. ගෙවීම් පත්‍රිකාවට ඇතුලත් කළ යුතු විස්තර

පහත සඳහන් විස්තර ගෙවීම් පත්‍රිකාවටඇතුලත් කළ යුතුය.

- ගෙවීම් කාලපරිච්ඡේද කේත ආකෘතිය (**YY/Q/0/M**)

  උදා:- 2022 ඔක්තෝබර් ගෙවීම් කේතය -22401

- බදු වර්ග කේතය : 32

බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකය, අනිකුත් විස්තර සමඟ ඉහත දී ඇති ගෙවීම් කේතය යොදා ගෙවීම් පත්‍රිකා භාවිතා කරමින් ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකට ගෙවීම් සිදු කළ හැකිය.

**සමාජ ආරක්ෂණ දායකත්ව බද්දට ලියාපදිංචි වූ පසුව, ලියාපදිංචිය සඳහා පිරිවැටුම් සීමාව නොසළකා සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද ගෙවිය යුතුය.**

## 5. බද්දට යටත් පිරිවැටුම (දෙවන උපලේඛනය)

| | **විස්තරය** | | **බද්දට යටත් පිරිවැටුම** |
|---|---|---|---|
| (i) | යම් ද්‍රව්‍යයක් ආනයනය කිරීම (රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් අය කරනු ලබන) | | ආනයන වටිනාකමෙන් 100% |
| (ii) | යම් ද්‍රව්‍යයක් නිෂ්පාදනය කිරීම | | පිරිවැටුමෙන් 85% |
| (iii) | සේවා සැපයීම | (අ) මූල්‍ය සේවා සැපයීම | මූල්‍ය සේවාවන්ට ආරෝපණය වන එකතු කල අගයෙන් 100%* |
| | | (ආ) ඉඩම් හා වැඩිදියුණු කිරීම් | පිරිවැටුමෙන් 100% ** |
| | | (ඇ) (අ) සහ (ආ) අයිතමයන්ට අදාළ නොවන සේවා | පිරිවැටුමෙන් 100% |
| (iv) | තොග සහ සිල්ලර වෙළඳාම*** | (අ) යම් භාණ්ඩ ශ්‍රී ලංකාවේදී නිෂ්පාදනය කරන්නකු හෝ නිපදවන්නකුට අදාළ ලියාපදිංචි බෙදාහරින්නකු**** විසින් යම් ද්‍රව්‍යයක් විකිණීම | පිරිවැටුමෙන් 25% |
| | | (ආ) ආනයනය කිරීම සහ විකිණීම ඇතුළුව ඉහත (අ) අයිතමයට අදාළ නොවන තොග වෙළඳාම හෝ සිල්ලර වෙළඳාම | පිරිවැටුමෙන් 50% |

* 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 25ඇ වගන්තිය යටතේ නිකුත් කර ඇති ගැසට් නිවේදනයේ නිශ්චය කර ඇති ආරෝපණය කළ හැකි ක්‍රමවේදය අදාළ කර ගනිමින් ගණනය කරනු ලබන මූල්‍ය සේවාවන්ට ආරෝපණය කළ හැකි එකතු කළ අගය

** පිරිවැටුම = විකුණුම් අගය - විකුණුම් දිනයට හිස් ඉඩමේ වෙළඳපොළ වටිනාකම

*** තොග සහ සිල්ලර වෙළඳාම යටතට පහත ගනුදෙනු ද අයත් වේ.

- මිලට ගැනීම සහ විකිණීම
- ආනයනය සහ විකිණීම
- නිපදවීම (produce) සහ විකිණීම (නිෂ්පාදනය කිරීම (manufacture) හා විකිණීම ඇතුළත් නොවේ.)

**** ලියාපදිංචි බෙදාහරින්නා යන්නෙන්, ශ්‍රී ලංකාවේ යම් භාණ්ඩ නිෂ්පාදකයෙකු හෝ නිපදවන්නකු සම්බන්ධයෙන් වන විට, කලින් කලට එම භාණ්ඩ නිෂ්පාදනය හෝ නිපදවන්නා විසින් නිශ්චය කරනු ලැබිය හැකි මිලකට, එම භාණ්ඩ තොග වෙළඳපොළේ විකිණීම සඳහා එම නිෂ්පාදකයා හෝ නිපදවන්නා විසින් පත්කරනු ලබන යම් තැනැත්තෙකු හෝ හවුල් ව්‍යාපාරයක් අදහස් වේ.

## 6. සමාජ ආරක්ෂණ බදු වාර්තා භාරදීම (8 වන වගන්තිය)

**වාර්තා භාරදීම සඳහා නියමිත දිනය**: අදාළ කාර්තාව අවසානයේ එළඹෙන මාසයෙහි 20 වන දින හෝ එදිනට පෙර

| කාර්තුව | නියමිත දිනය |
|---|---|
| පළමු කාර්තුව (ජනවාරි පළමු වන දින සිට මාර්තු තිස් එක් වන දින දක්වා) | අප්‍රේල් විසි වන දින |
| දෙවන කාර්තුව ( අප්‍රේල් පළමු වන දින සිට ජුනි තිස් වන දින දක්වා) | ජූලි විසි වන දින |
| තුන්වන කාර්තුව ( ජූලි පළමු වන දින සිට සැප්තැම්බර් තිස් වන දින දක්වා) | ඔක්තෝබර් විසි වන දින |
| හතරවන කාර්තුව ( ඔක්තෝබර් පළමු වන දින සිට දෙසැම්බර් තිස් එක් වන දින දක්වා | ජනවාරි විසි වන දින |

**භාරදීම:**

**(i)** දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අදාළ නගරබද/ප්‍රාදේශීය කාර්යාලවලට හෝ

**(ii)** දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි පළමු වන මහලේ පිහිටා ඇති මධ්‍යම ලිපිලේඛන කළමනාකරණ අංශය වෙත

## 7. පිරිවැටුම (3 වන වගන්තිය)

සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත අදාළ වන තැනැත්තන් සම්බන්ධයෙන් වන පිරිවැටුම පහත පරිදි වේ :-

(අ) යම් ද්‍රව්‍යයක් ආනයනය කිරීමෙන් උපචිත වන පිරිවැටුම යන්නෙන් 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 6 වන වගන්තිය යටතේ එකතු කළ අගය මත බද්දේ කාර්යය සඳහා නිශ්චය කරන ලද එම ද්‍රව්‍යයේ වටිනාකම අදහස් වන නමුත් සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනතේ පළමුවන උපලේඛනයේ Iඅ කොටසේ දක්වා ඇති යම් නිදහස් කරන ලද ද්‍රව්‍යයක වටිනාකම ඇතුළත් නොවේ. (CIF වටිනාකම+රේගු බදු+සෙස් බද්ද + වරාය සහ ගුවන් තොටුපල බද්ද + රේගුවට ගෙවිය යුතු නිෂ්පාදන බදු හෝ වෙනත් යම් බද්දක් + CIF වටිනාකමින් 10%ක්)

(ආ) යම් අදාළ කාර්තුවක් සම්බන්ධයෙන් වන විට, පළමුවන උපලේඛනයේ Iඅ කොටසේ දක්වා ඇති යම් නිදහස් කරන ලද ද්‍රව්‍යයක් හැර, එකී තැනැත්තා විසින් යම් ද්‍රව්‍යයක් ශ්‍රී ලංකාව තුළ දී නිෂ්පාදනය කර විකිණීමෙන් එකී කාර්තුව තුළ ලැබිය යුතු මුදල, එම මුදල ලැබුණේ වුව ද, නොලැබුනේ වුව ද, එසේ ලැබිය යුතු මුදල අදහස් වේ.

(ඇ) ඕනෑම සේවාවක් සපයන ව්‍යාපාරයක් පවත්වාගෙන යන තැනැත්තෙකු සම්බන්ධයෙන් වන විට අදාළ කාර්තුව සඳහා පිරිවැටුම පහත පරිදි වේ,

**(i)** යම් **මූල්‍ය සේවා** සැපයීමේ ව්‍යාපාර

අදාල කාර්තුව සඳහා පිරිවැටුම යන්නෙන් ශ්‍රී ලංකාවේ මූල්‍ය සේවා සැපයීමේ ව්‍යාපාරයේ යෙදී සිටින යම් තැනැත්තෙකු විසින් ශ්‍රී ලංකාව තුල යම් මූල්‍ය සේවා සැපයීම කරගෙන යාම මඟින් ලැබිය යුතු මුදල, එම මුදල ලැබුණේ වුව ද, නොලැබුණේ වුව ද, එසේ ලැබිය යුතු මුදල අදහස් වන නමුත් සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනතේ පළමුවන උපලේඛනයේ II වන කොටසේ දක්වා ඇති නිදහස් කරන ලද සේවා ඇතුලත් නොවේ;

**(ii)** **දේපළ වෙළඳාම් සහ වැඩි දියුණු කිරීමේ ව්‍යාපාරයක්** පිළිබඳව,

අදාළ කාර්තුව සඳහා පිරිවැටුම යන්නෙන් 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ කාර්යය සඳහා එකී බදු පනතේ 5 වන වගන්තියේ (7) වන උප වගන්තිය යටතේ නිශ්චිතව ගණනය කරන ලද යම් දේපළ වෙළඳාම් සහ වැඩි දියුණු කිරීමේ ව්‍යාපාරයක් උපචිත වන යම් සේවා වටිනාකමක් අදහස් වන නමුත් සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනතේ පළමු වන උපලේඛනයේ II වන කොටසේ දක්වා ඇති නිදහස් කරන ලද සේවා ඇතුලත් නොවේ;

**(iii)** අදාළ කාර්තුව සඳහා පිරිවැටුම යන්නෙන් ඉහත (i) සහ (ii) හි දක්වා ඇති සේවා සහ සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනතේ පළමුවන උපලේඛනයේ II වන කොටසේ දක්වා ඇති යම් නිදහස් කරන ලද සේවාවක් හැර, ශ්‍රී ලංකාව තුළ **යම් සේවාවක්** සැපයීම මඟින් ලැබිය යුතු මුදල, එම මුදල ලැබුණේ වුව ද, නොලැබුණේ වුව ද එසේ ලැබිය යුතු මුදල අදහස් වේ.

(ඇ) යම් ද්‍රව්‍ය නිෂ්පාදනය කරන්නෙකු වන නිෂ්පාදකයෙකු විසින් සිදු කරන විකිණීමක් හැර එවැනි ද්‍රව්‍යයක් ආනයනය කිරීම සහ විකිණීම ඇතුළුව යම් ද්‍රව්‍යයක් **තොග වෙළඳාම් හෝ සිල්ලර වෙළඳාම් කිරීමේ ව්‍යාපාරයක්** පවත්වාගෙන යන තැනැත්තෙකු සම්බන්ධයෙන් වන විට සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනතේ පළමුවන උපලේඛයේ Iආ කොටසේ දක්වා ඇති යම් නිදහස් කරන ලද යම් ද්‍රව්‍යයක් හැර, ශ්‍රී ලංකාව තුළ යම් ද්‍රව්‍යයක් තොග වෙළඳාමෙන් හෝ සිල්ලර වෙළඳාමෙන් ලැබිය යුතු මුදල, එම මුදල ලැබුණේ වුව ද, නොලැබුණේ වුව ද එසේ ලැබිය යුතු මුදල අදහස් වේ.

(අ), (ආ) සහ (ඇ) ඡේදවල කාර්යයන් සඳහා පිරිවැටුම යන්නට පහත දෑ ඇතුළත් නොවේ.

- එම කාර්තුවේදී එකී තැනැත්තා විසින් දරණ ලද යම් බොල් ණයයක්
- එම අදාළ කාර්තුව සඳහා ගෙවන ලද 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත යටතේ වූ යම් එකතු කළ අගය මත බද්දක්
- අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද යම් ජාත්‍යන්තර ඉසව්වක් සම්බන්ධයෙන් අපනයන සංවර්ධන ප්‍රදාන යටතේ ගෙවන ලද යම් ප්‍රදානයක්

**යම්අදාළ කාර්තුවක් තුළ ආපසු අය කර ගන්නා ලද යම් බොල් ණයයක්, එසේ ආපසු අය කරගත් කාර්තුවේ පිරිවැටුම සඳහා ඇතුළත් කරනු ලැබිය යුතුය.**

**8. බදු බැර සහ ආපසු ගෙවීමේ ක්‍රමවේදය (36 වන වගන්තිය)**

යෙදවුම් බැර හෝ ආපසු ගෙවීමේ ක්‍රමවේදයක් පනතෙහි නොමැත. කෙසේ වෙතත් යම් කාර්තුවක් සඳහා යම් තැනැත්තෙකු ගෙවීමට බැඳී සිටින ප්‍රමාණය ඉක්මවා බද්දක් හෝ දණ්ඩණයක් එකී තැනැත්තා විසින් ගෙවා ඇත්නම් අදාළ කාර්තුවට ඉන් ඉක්බිතිව එළඹෙන ඕනෑම කාර්තුවක් සඳහා සිදු කර ඇති අත්තිකාරම් ගෙවීම් ලෙස සළකනු ලැබේ.

**9. අනුකූල නොවීම සඳහා වන දණ්ඩණ**

(අ) නියමිත කාලසීමාව තුළ ලියාපදිංචි වීම සඳහා අයදුම් කිරීමට අපොහොසත් වීම - රු.25,000/- නොඉක්මවන දණ්ඩණයක්

(ආ) වාර්තාවක් සැපයීමට අපොහොසත් වීම - රු.50,000/- නොඉක්මවන දණ්ඩණයක්

(ඇ) ගෙවීම් පැහැර හැරීම -

අ) ගෙවීම් පැහැර හැරිය ප්‍රමාණයෙන් 10%ක්; සහ

ආ) ගෙවීම් පැහැර හරින ලද සෑම අතිරේක මාසයක් සඳහා අතිරේක2%ක්

දණ්ඩන ලෙස ගෙවිය යුතු මුළු මුදල, ගෙවීම් පැහැර හැර ඇති බදු ප්‍රමාණයෙන් 100% නොඉක්මවිය යුතුය.

**10. ලියාපදිංචිය අවලංගු කිරීම (5 වන වගන්තිය)**

පහත අවස්ථාවන්හිදී, ලියාපදිංචි වූ තැනැත්තන් විසින් ලියාපදිංචි වූ දින සිට මාස දොළහක කාල පරිච්ඡේදයක් ඉක්මවීමෙන් පසුව, ඕනෑම අවස්ථාවක සිය ලියාපදිංචිය අවලංගු කරගැනීම සඳහා අයදුම්පත්‍රයක් කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ හැකිය.

- ලියාපදිංචි වූ තැනැත්තා 2 වන වගන්තියේ දක්වා ඇති ව්‍යාපාරය නවතා දමා ඇති අවස්ථාවක දී
- එවැනි ලියාපදිංචි වූ තැනැත්තෙකුගේ සමුච්චිත පිරිවැටුම අදාළ කාර්තුවට පෙරාතුවම වූ එක් එක් කාර්තු හතර තුළදී රුපියල් මිලියන එකසිය විස්ස නොඉක්මවන අවස්ථාවක දී

**11. වැඩිදුර තොරතුරු සඳහා**

වැඩිදුර තොරතුරු සඳහා යන විද්‍යුත් තැපෑලට විද්‍යුත් පණිවිඩයක් ලබා දීම හෝ පහත සඳහන් දුරකතන අංක හරහා පහත දක්වා ඇති නිලධාරීන් ඇමතීමට කටයුතු කරන්න

නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් (බදු ප්‍රතිපත්ති, නීති සම්පාදනය හා ජාත්‍යන්තර සබඳතා) - 011 213 5412

නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් (බදු සේවා) - 0112134830

ජ්‍යෙෂ්ඨ කොමසාරිස් (ලේකම් අංශය) - 0112135410

කොමසාරිස් (බදු ප්‍රතිපත්ති හා නීති සම්පාදනය) - 0112135412

කොමසාරිස් (බදු ලියාපදිංචි කිරීමේ අංශය) - 0112134201

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් (බදු ප්‍රතිපත්ති හා නීති සම්පාදනය) - 011 213 5441 **/34/38/33/35/32**

# දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්

බදු - වඩා හොඳ අනාගතයකට